**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන .**

**1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 13 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

**1.2 . මතය .**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් .**

**1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

**1.3.2 .** ගණකාධිකරණ අඩුපාඩු .

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන් හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

**1.3.3 .** බැංකු ගිණුම් .

බැංකු ගිණුමෙහි රු . 144,080 ක් වූ නොසැසඳූ හර ශේෂයන් පැවතුණි .

**1.3.4** විගණනය සඳහා සාක්ෂි නොවීම .

විගණන විමසුම් 06 ක් සඳහා 2010 දෙසැම්බර් 31 දින වන විට පිළිතුරු සපයා නොතිබුණි . විගණන විමසුම් වලට අදාල ප්‍රමාණ කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු . 163,277 ක් විය .

**1.3.5 .** අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරික්ෂණය විය .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | අනුකූල නොවීම් . |
| --- | --- |
| ( අ ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 . | |
| රීති අංක 180 | - මුදල් සහ ගබඩා පරිහරණය කරනු ලබන නිලධාරින් ආරක්ෂිත ඇප තබා නොතිබුණි . |

රීති අංක 217 - සභාව පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි .

රීති අංක 218 - සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි .

( ආ ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත . - රු. 12,861 ක් වූ රැඳවුම් බදු අඩු නොකොට ගෙවීම් සිදුකර තිබුණි .

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

මු.රෙ. 571 - 2008 සහ 2009 වර්ෂ සඳහා ආදායමට බැර කළ යුතු නැත්පතු රු . 803,932 ක් සභාව විසින් මේ දක්වා ආදායමට බැර කර නොතිබුණි .

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය .

### 2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම අතිරික්තය රු. 128,878 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු . 1,057,295 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය .

#### 2.2.1 . ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|

| | | | | සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 02 | 02 | 02 |
| (ii) | බදු කුලී | 192 | 123 | 69 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 217 | 2,220 | - |
| (iv) | වෙනත් ආදායම් | 15,432 | 1,255 | - |

**2.2.2 . උසාවි දඩ .**

අක්කරපත්තු මහේස්ත්‍රාත් උසාවිය එකතු කරන ලද රු . **2,296,742** ක් වූ උසාවි දඩ අයකර පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ද කටයුතු කර නොතිබුණි .

**2.2.3 . මුද්දර ගාස්තු .**

**2010** දෙසැම්බර් **31** දිනට රු . **542,150** ක් වූ මුද්දර ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

**2.3 . වියදම් ව්‍යුහය .**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම , තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | |
| | රු . ' 000 | රු . ' 000 | රු . ' 000 |
| පෞද්ගලික පඩිනඩි | 9,950 | 9,950 | - |
| වෙනත් | 3,376 | 3,376 | - |
| උප එකතුව | 13,326 | 13,326 | - |
| ප්‍රාග්ධන වියදම් | 2,447 | 2,447 | - |

| | | | |
|---|---|---|---|
| | ----------- | ----------- | ---------- |
| මුළු එකතුව | 15,773 | 15,773 | - |
| | ======= | ======= | ====== |

**2.4 . මානව සම්පත් කළමනාකරණය .**

**අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .**

**2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ .**

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | 01 | - |
| ද්විතියික ශ්‍රේණි | 05 | 13 |
| ප්‍රාථමික ශ්‍රේණි | 18 | 15 |
| වෙනත් | - | 10 |
| | 24 | 38 |

**2.5 . වත්කම් කළමනාකරණය .**

**(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු සේවක ණය ශේෂයන්හි එකතුව රු . 277,977 ක් විය . එයින් වර්ෂය ඉක්ම වූ ශේෂ එකතුව රු . 261,959 ක් විය .**

**(ආ) 2008 සිට 2009 කාල පරිච්ඡේදය සඳහා සභාව විසින් ආදායම් බැර කළ යුතු රු . 803,932 ක් වූ තැන්පතු මේ දක්වා ආදායමට බැර කර නොතිබුණි .**

**(ඇ) ටෙන්ඩර් තැන්පතු රු . 129,907 ක් ආපසු නොගෙවා තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි .**

**(ඇ)** **සභාවට අයත් භාණ්ඩ විෂයයන් 13 ක් දිගු කලක් තුල උපයෝජනය නොකොට පැවතුණි .**

**2.6** **සම්පූර්ණයෙන් අත්හැර දැමූ ව්‍යාපෘති**

**පහත සඳහන් ව්‍යාපෘති මුළු මනින්ම අත්හැර දමා තිබුණි .**

| ව්‍යාපෘති | ඇස්තමේන්තුගත වටිනාකම | 2010 දෙසැම්බර් 31 දක්වා වියදම | හේතුව |
|---|---|---|---|
| 03 | 765,951 | නැත | කොන්ත්‍රාත්කරුගේ නොසැලකිලිමත් බව . |

**2.7 .** **අභ්‍යන්තර විගණනය .**

**ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .**

**3 .** **පද්ධති හා පාලන .**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**( අ )** **ගිණුම්කරණය .**

**( ආ )** **ස්ථාවර වත්කම් පාලනය .**

**( ඇ )** **ආදායම් පරිපාලනය .**